# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2022 අංක 29 දරන අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 ඔක්තෝබර් මස 28 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 15.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2022 අංක 29 දරන අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 25 වන දින]

එල්.ඩී.—ඕ. 49/2021

### (60 වන අධිකාරය වූ) අන්තිම කැමති පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක 29 දරන අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

60 වන අධිකාරයේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (60 වන අධිකාරය වූ) අන්තිම කැමති පත්‍ර ආඥාපනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීම

2. (1) වයස අවුරුදු දහ අටට එළඹ ඇත්තා වූ සහ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින්නා වූ යම් තැනැත්තකු විසින්, එකී තැනැත්තා මිය යන අවස්ථාවේ දී එකී තැනැත්තා ට අයත් සහ එකී තැනැත්තා විසින් පැවරීමක්, රික්තාවරණය කිරීමක් හෝ බැහැර කිරීමක් නොකළේ නම්, දේපළ දැරීමට නීත්‍යානුකූලව නුසුදුස්සකු නොවන එකී තැනැත්තාගේ උරුමකරුවන් වෙත පැවරෙන්නා වූ යම් නිශ්චල හෝ චංචල දේපළක් සහ යම් දේපළක සියලු සහ සෑම බූදල්, අයිතිවාසිකම්, කොටස් හෝ සම්බන්ධතා, යෝග්‍ය බවට ඔහු විසින් සලකනු ලබන ආකාරයට, පැවරීමට සහ බැහැර කිරීමට අන්තිම කැමති පත්‍රයක් ලිවීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සෑම තෙස්තමේන්තුකරුවකුට ම තමා විසින් බැහැර කිරීමට අවශ්‍ය බවට සලකනු ලබන එවැනි තෙස්තමේන්තු නීයාදනයක් සිදු කිරීම සඳහා පූර්ණ බලය තිබිය යුතු අතර, එම අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රී ලංකාවේ දැනට බලාත්මක වන හෝ මින් පෙර බලාත්මකව පැවති යම් නීතියක, භාවිතයක හෝ චාරිත්‍රයක පටහැනිව කුමක් සඳහන් වුව ද, බැහැර කිරීම, උරුමය අහිමි කිරීම හෝ සඳහන් නොකිරීම

පිළිබඳ හේතු දැක්වීමෙන් තොරව එකී නියාදනයක දී යම් ළමයකු, දෙමාපියකු, ඥාතියකු හෝ පැවත එන්නකු ව බැහැර කිරීමට, එවැනි යම් තැනැත්තකුගේ උරුමය අහිමි කිරීමට හෝ එවැන්නකු ව සඳහන් නොකර සිටීමට සෑම තෙස්තමේන්තුකරුවකුට ම පූර්ණ අයිතියක් ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත් කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ඉවත් කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) මෙම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස අංකනය කිරීමෙන්; සහ

(2) එම නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) හවුල් අන්තිම කැමති පත්‍රයක තෙස්තමේන්තුකරුවකු මියයන අවස්ථාවක දී, අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීම සඳහා එම අන්තිම කැමති පත්‍රය ද අමුණමින් අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් හෝ ප්‍රොබේට් බලපත්‍රයක් ලබා ගැනීම පිණිස, අවස්ථාවෝචිත පරිදි, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXXVIII වන හෝ XXXVIIIආ වන පරිච්ඡේද යටතේ තෙස්තමේන්තු නඩු කටයුතු ගොනු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ සඳහන් "එම ඉඩම මත ඉදිකරන ලද ගොඩනැගිලි" යන වචන වෙනුවට "එම ඉඩම මත ඉදිකරන ලද ගොඩනැගිලි, සහාධිපත්‍ය දේපළ කොටස හෝ ඉඩම් කොටස" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.